# සියනෑ කෝරළයේ ගඟබඩපත්තුවේ නව ප්‍රාග්ඓතිහාසික සාධක

ගයාන් ශ්‍රියානන්ද

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
sanjeewasgayan@gmail.com

---

සියනෑ කෝරළයේ ගඟබඩපත්තුව තුළ නිශ්චිත වශයෙන්ම ප්‍රාග්ඓතිහාසික මානව වාසස්ථානයක් හෝ එවැනි ප්‍රාග් මානව ක්‍රියාකාරකමකට සාක්ෂි සපයන පුරාවිද්‍යාත්මක සාධකයක් හෝ හමුවී නොතිබුණ ද ක්ෂේත්‍ර ගවේෂණයකින් හඳුනාගත් එවැනි සාධක සහිත කලාපයක් පිළිබඳව අනාවරණය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම පර්යේෂණයට බඳුන් වූ ස්ථානය බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයෙහි කිරිඳිවැල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දංගල්ල ග්‍රාම නිලධාරී වසමෙහි, අඹකුඹුර ග්‍රාමයෙහි පිහිටා තිබේ.

පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් සාධක හමුවන්නේ අඹකුඹුර ග්‍රාමයෙහි හේනේගන්කන්ද නමින් හඳුන්වන කන්දෙහි නැගෙනහිර බෑවුමෙහි පහළ කොටසේ කන්ද දෙසට විහිදී ගිය පාෂාණ උද්ගත දෙකකිනි. පළමු ගල්කුළ මත හා දෙවන ගල් කුළ පාමුල තැන්පත් වී තිබෙන පස් තැන්පතු ප්‍රාග්ඓතිහාසික සාධකවල බහුල ව්‍යාප්තියක් පෙන්නුම් කරයි. දෙවන ගල් කුළෙහි ඇති ආනත බව නිසාවෙන් එය පාමුල වර්ෂාවෙන් ආරක්ෂා වී සිටිය බව පර්යේෂණයේදී හඳුනාගනු ලැබිණි. මෑතකාලීනව මෙම පර්වතය පාමුලින් පස් ඉවත් කිරීමේදී නිරාවරණය වූ පාංශු හරස්කඩකින් අඟුරු ස්තරයක් හා තැනින් තැන විසිරී තිබෙන තිරිවාන කැබලි හඳුනාගනු ලැබිණි. වර්ෂාව සහ වෙනත් ක්‍රියාකාරකම් හේතුවෙන් නිරාවරණය වූ තැලුම් ගල් සහ පතුරු ආයුධ යැයි උපකල්පනය කළ හැකි සාධක හඳුනාගනු ලැබිණි. මෙම පර්වත අතරින් ඉහළ ගල් පර්වතයේ දෘඩ නියඟයකදී පවා නොසිඳෙන දියකෙම් දෙකක් නිරාවරණය කරගනු ලැබිණි. තෙත් කලාපීය ප්‍රාග්මානවයන් ආහාරයට ගෙන තිබෙන වල්දෙල්, වෙරලු, කිතුල් ආදී ශාක වර්තමානයේ පවා මෙම ස්ථානය අවට දැකගත හැකිය. ක්ෂේත්‍රයෙහි ඇතැම් කලාපවල පතුරු මෙවලම් විශාල වශයෙන් විසිරී තිබෙනු දක්නට ලැබිණි. මෙම මෙවලම් යැයි සැලකෙන කොටස් සුදු සහ වීදුරු තිරිවානා වර්ගයන්ට අයත්වේ. එසේ ම විවිධ හැඩයෙන් හා ප්‍රමාණයෙන් යුතු තැලුම් ගල් රාශියක් ද ක්ෂේත්‍රය මතුපිට තිබී හමුවිය. මෙම ඛනිජ ක්ෂේත්‍රය අවට කිසිදු ස්ථානයකින් හමු නොවන අතර මෙම ස්ථානයට කිලෝමීටර තුනක් පමණ දුරින් ගලා බසින කැලණි ගංගාවෙන් පමණක් හඳුනාගනු ලැබිණි. ප්‍රාග්ඓතිහාසික සාධක ඉක්මවා යමින් ඓතිහාසික යුගයෙහි සාධක ද මෙම ස්ථානයෙන් හඳුනාගනු ලැබිණි. වර්ෂාව වැනි ස්වාභාවික හේතූන් නිසා මෙම ක්ෂේත්‍රය තුළ තිබෙන සාධක බොහෝමයක් විනාශවෙමින් පවතියි. මෙම ක්ෂේත්‍රයෙහි ඉතා විධිමත් පර්යේෂණයකින් නිරාවරණය කරගත හැකි සාධක විශාල ප්‍රමාණයක් වන බව අවබෝධ කරගත් හෙයින් අනාගතයේ විධිමත් පර්යේෂණයකට අවතීර්ණ වීමට බලාපොරොත්තු වේ.

ප්‍රමුඛ පද : හේනේගන්කන්ද, තිරිවාන, ක්ෂේත්‍ර ගවේෂණ, සියනෑ කෝරළය, කැලණි ගඟ